වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කාර්යාලය තුළ, මහතොඩුවාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයට තුළ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, පිටිගල් කෝරළේ, යටකලන් පත්තුව හි උතුරු තොඩුවාව නමැති ග්‍රාමයෙහි පිහිටි "තාගහවත්ත" නමැති ඉඩම බලයලත් මානක ඒ. ඒ. විමලසේන මහතා විසින් මැන සාදන ලද 1993.04.03 දිනැති අංක 343 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 03 ලෙස බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දුට සහ ඩබ්ලිව්. ජේ. ඩේවිඩ් යන අයට අයත් ඉඩම සහ පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර ද, බටහිරට : (කැබලි අංක 02) පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දාහතක් (අ. 0, රූ. 3, පර්. 17) වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 103/03 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම සහ පරිශ්‍රය මත පිහිටි සියලුම ගොඩනැගිලි, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ සවිකිරීම, එකී ඉඩම් කැබැල්ලට දැනට හෝ මෙයින් පසුව කලින් කලට ඇති කරන හෝ ස්ථිර වශයෙන් සිදු කරන ඇමුණුම් සහ සේවා ද, සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ උපකරණ සමග ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

1 - 64

---

### මහජන බැංකුව - වැල්ලවත්ත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය.

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.09.19 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපලෙහි උකස්කරු වශයෙන් බටගොඩගේ ලක්ෂ්මන් ප්‍රනාන්දු යන අය විසින් උකස් කරන ලද සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ විසින් සහතික කරන ලද 2013.12.18 වැනි දින අංක 6107 දරන උකස් බැඳුම්කරය සහ 2017.07.08 වැනි දින අංක 7516ඒ දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 192A, දෙහිවල පාර, බොරලැස්ගමුව යන ලිපිනයේ පිහිටා ඇත්තා වූ ද PV 61755 දරන අංකය යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන ඇලුවිච් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් පැහැර ඇති හෙයින් ද,

එකී උකස් බැඳුම්කර මත දැනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන දෙකයි නවලක්ෂ හැත්තෑ දෙදහස් තුන්සිය අනූපහයි ශත පනස් හතක් වූ මුදලක් (රු. 2,972,395.57) ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදු කර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව විකුණුම් පිරිවැය සහ වෙනත් විකිණුම් ගාස්තු සමග 2018.08.03 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 21.5% ක් වූ පොලී මුදලක් ද සමග රුපියල් මිලියන එකයි එක් ලක්ෂ හැට හය දහස් පන්සිය අනූ පහයි ශත විසි හතරක් වූ මුලු මුදලක් (රු. 1,166,595.24) සහ 2018.08.03 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 18% ක් වූ පොලී මුදලක් ද සමග රුපියල් මිලියන එකයි හාරලක්ෂ දාසය දහස්

හයසිය හැට හයයි ශත හැට අටක් වූ මුදලක් (රු. 1,416,666.68) අය කර ගැනීම සඳහා ඉහත කී අංක 6107ඒ සහ 7516 දරන උකස් බැඳුම්කර මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පත්තුවේ, කැස්බෑව මහනගර සභා සීමාව තුළ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලිගෙදර අංක 583ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුල පිළියන්දල මකුලුදූව පිහිටා ඇත්තා වූ ද අබේරත්න මාවත, වරිපනම් අංක 119/22 දරන "මකුලුදූව එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු වයි. පී. ද සිල්වා විසින් සාදන ලද 1998.11.01 වැනි දින අංක 827A දරන පිඹුරේ "ලොට් 20" ලෙස ලකුණු කරන ලද, උතුරට : එම ඉඩමේම කොටසක් ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙහි ලොට් අංක 21 ද, බස්නාහිරට : මෙහි ලොට් අංක 19 ද යන මායිම් තුල පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් නවයක් (අ. 0, රූ. 0, පර්. 9) හෙවත් හෙක්ටයාර් 0.0228 වූ ලොට් අංක 20 දුන ඉහත කී බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොල සහ වෙනත් සියල දේ ද වේ.

තව ද, මේ සඳහා එකී අංක 827A දරන පිඹුරේ පෙන්වා දී ඇති පොදු මාර්ග පරවශතා අයිතිය ද ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කලාප කළමණාකරු,
(කොළඹ දකුණ).

කලාප ප්‍රධාන කාර්යාලය - (බස්නාහිර කලාපය - 01)
අංක 11,
ආදිපාද වීදිය,
කොළඹ 01.

01 - 160

---

### ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 නොවැම්බර් මස 28 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ගිලිෂියන් පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2014.11.28 වැනි දිනැති අංක 4326, ප්‍රසිද්ධ නොතාරිස් ගිලිෂියන් පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2016.11.23 වැනි දිනැති අංක 4994, ප්‍රසිද්ධ නොතාරිස් ගිලිෂියන් පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2017.06.27 වැනි දිනැති අංක 5225, ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කරන ලද 2017 ජූනි මස 30 වැනි දිනැති අංක 10462 හා ප්‍රසිද්ධ නොතාරිස් ගිලිෂියන් පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2018.07.26 වැනි දිනැති අංක 5534 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, දඹුලු එන්ටර්ප්‍රයිසස් යන නාමය අභිධානය හා විලාසය යටතේ කුරුණෑගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන කුරුණෑගල ලසන්ත චන්දික රණවීර පතිරණ අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2018 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී ලසන්ත චන්දික රණවීර පතිරණ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී වෙත ඉහත කී අංක 4326, 4994, 5225, 10642 හා 5534 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් පහළොස් කෝටි නව ලක්ෂ අසූ දහස් තුන්සිය හැත්තෑ තුනයි ශත අසූ එකක (රු. 150,980,373.81) මුදලක් ද, 2018 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් කෝටි අසූ ලක්ෂය (රු. 78,000,000.00) මුදල මත සෑම මාසයකටම වරක් ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත වන පොලිය ද රුපියල් එක් කෝටි හැට පන් ලක්ෂ අසූ නව දහස් තුන්සිය හැත්තෑ පහක (රු. 16,589,375.00) මුදල මත සෑම මාසයකටම වරක් ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට අටක් (8%) බැගින් වූ අනුපාතය මත වන පොලිය ද රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක (රු. 15,000.000.00) මුදල මත මාසයකට වරක් ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකය (අවසන් සතිය මාසික ස්ථානීය) ඉහළින් වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ පොලිය ද සහ රුපියල් තුන් කෝටි පනස් හය ලක්ෂ අනූ දහස් හාරසිය දහ අටයි ශත අසූ හතරක (රු. 35,690,418.84) මුදල මත වර්ෂයකට සියයට විසි අට බැගින් (28%) වූ අනුපාතිකය මත පොලිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් පහළොස් කෝටි නව ලක්ෂ අසූ දහස් තුන්සිය හැත්තෑ තුනයි ශත අසූ එකක (රු. 150,980,373.81) මුදලක් ද, 2018 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් කෝටි අසූ ලක්ෂයක (රු. 78,000,000.00) මුදල මත සෑම මාසයකටම වරක් ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත වන පොලිය ද රුපියල් එක් කෝටි හැට පන් ලක්ෂ අසූ නව දහස් තුන්සිය හැත්තෑ පහක (රු. 16,589,375.00) මුදල මත සෑම මාසයකටම වරක් ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට අටක් (8%) බැගින් වූ අනුපාතය මත වන පොලිය ද රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක (රු. 15,000.000.00) මුදල මත මාසයකට වරක් ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකය (අවසන් සතිය මාසික ස්ථානීය) ඉහළින් වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ පොලිය ද සහ රුපියල් තුන් කෝටි පනස් හය ලක්ෂ අනූ දහස් හාරසිය දහ අටයි ශත අසූ හතරක (රු. 35,690,418.84) මුදල මත වර්ෂයකට සියයට විසි අට බැගින් (28%) වූ අනුපාතිකය මත පොලිය ද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමඟ අනුකූලව ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ලසන්ත චන්ද්‍රික රණවීර පතිරණ යන අය විසින් ඉහත කී අංක 4326, 4994, 5225, 10642 හා 5534 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල, අයි. ඩබ්ලිව්. ජයසූරිය, මහනුවර බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැංක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

### *පළමුවන උපලේඛනය*

### අංක 4326 හා 4994 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා බල සීමාව ඇතුළත, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුණෑගල නගර (මධ්‍යම) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පල්ලේවල්පොල මීගමුව පාරේ වරිපනම් අංක 129 දරන ගලහිටියාවේ කුඹුර සහ ගංගොඩයා කුඹුර දැන් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක විසින් මැන සාදන ලද 2014.11.02 වැනි දිනැති අංක 7191 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන මාර්ගය (මීගමු පාර) සහ අංක 167/83 පිඹුරේ ලොට් 1බී ද, නැගෙනහිරට : අංක 167/83 පිඹුරේ ලොට් 1බී ද, දකුණට : වාන් ඇල ඔස්සේ වන අඩි 10 ක් පළල රක්ෂිතය සහ අංක 6066 දරන පිඹුරේ ලොට් 01 සහ බස්නාහිරට : අංක 6066 දරන පිඹුරේ ලොට් 01 සහ ප්‍රධාන මාර්ගය (මීගමු පාර) ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 18.2) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ වැවිලි ළිඳ ඇතුළු අනෙකුත් සෑම සියලු දේ ද වේ.

ඉහත කී ලොට් 1 පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද්දක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා බල සීමාව ඇතුළත, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුණෑගල නගර (මධ්‍යම) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පල්ලේවල්පොල මීගමුව පාරේ වරිපනම් අංක 129 දරන ගලහිටියාවේ කුඹුර සහ ගංගොඩයා කුඹුර දැන් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද 1983.10.21 වැනි දිනැති අංක 167/83 දරන පිඹුරේ ලොට් 1ඒ වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : මීගමු පාර ද, නැගෙනහිරට : ලොට් 1බී ද, දකුණට : වාන් ඇල ද සහ දකුණු-බස්නාහිරට : වාන් ඇල ද වශයෙන් මායිම් වූ එකී අංක 167/83 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් අටක් (අ. 0, රූ. 1, පර්. 8) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි ඇතුලු අනෙකුත් සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

### *දෙවන උපලේඛනය*

### අංක 10462 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා බල සීමාව ඇතුළත, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 839 කුරුණෑගල නගර (මධ්‍යම) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පල්ලේවල්පොල පිහිටි මීගමුව පාරේ වරිපනම් අංක 129/2ඒ දරන " ගලහිටියාවේ කුඹුර" සහ "ගංගොඩයා කුඹුර" දැන් "වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක විසින් මැන සාදන ලද 2017.02.11 වැනි දිනැති අංක 6066/ඒඑම් දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මීගමුවේ සිට කුරුණෑගල දක්වා දිවෙන පාර (ප්‍රධාන මාර්ගය) සහ අංක 6171/ඒඑම් පිඹුරේ ලොට් 2 ද, නැගෙනහිරට : අංක 6171/ඒඑම් පිඹුරේ ලොට් 2 ද, දකුණට : අඩි 10 ක් පළල රක්ෂිතය ද සහ බස්නාහිරට : මීගමු පාර වරිපනම් අංක 129ඒ පරිශ්‍රය සහ මීගමුවේ සිට කුරුණෑගල දක්වා දිවෙන පාර ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 9.3) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සෑම සියලු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක විසින් මැන සාදන ලද 2017 පෙබරවාරි මස 11 දිනැති අංක 6066/ඒඑම් දරන පිඹුරේ දක්වා ඇති මාර්ග භාවිතා කිරීමේ අයිතිය ද සමඟ වේ.

ඉහත කී ලොට් 1 පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද්දක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා බල සීමාව ඇතුළත, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුණෑගල නගර (මධ්‍යම) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පල්ලේවල්පොල පිහිටි මීගමුව පාරේ වරිපනම් අංක 129 දරන ගලහිටියාවේ කුඹුර සහ ගංගොඩයා කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද 1983.10. 21 දිනැති අංක 167/83 දරන පිඹුරේ ලොට් 1ඒ වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : මීගමු පාර ද, නැගෙනහිරට : ලොට් 1බී ද, දකුණට : වාන් ඇල ද, දකුණු-බස්නාහිරට: වාන් ඇල ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් අටක් (අ. 0, රූ. 1, පර්. 8) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැව්ලි ඇතුළු අනෙකුත් සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

**අංක 5225 හා 5534 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

ඉහත පළමුවන සහ දෙවන උපලේඛනයන්හි විස්තර කර ඇති දේපළ අංක 5225 හා 5534 දරන උකස් බැඳුම්කරයන් මඟින් ලියා අත්සන් කොට ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01 - 137

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018 නොවැම්බර් 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. ආර්. එන්. එල්. ගුණතිලක විසින් සහතික කරන ලද 2017.05.26 දිනැති අංක 461 දරන උකස් බැඳුම්කරයට අනුව ණය පහසුකම 1 මත 2018.10.17 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හතලිස් එක් ලක්ෂ හතලිස් අටදහස් තුන්සිය හතලිස් අටයි ශත අසූ අට (රු. 4,148,348.88) මුදල සමඟ 2 වන ණය පහසුකම මත අයවිය යුතු රුපියල් දහඅට ලක්ෂ හැට අට දහස් හයසිය හැට අටයි ශත හතලිස් හතර (රු. 1,868,668.44) මුදල සමඟ ණය පහසුකම 1 හි පිහිටි මුල් මුදල වන රුපියල් තිස්නව ලක්ෂ අටදහස් තුන්සිය හැට තුනයි ශත විසිඅට (රු. 3,908,363.28) මුදල මත වසරකට සියයට නවයයි දශම පහ (9.5%) බැගින් 2018.10.18 දින සිට තවදුරටත් පොලිය ද ණය පහසුකම 2 හි පිටහිටි මුල් මුදල වන රුපියල් දහහත් ලක්ෂ පනස් නව දහස් හාරසිය හැත්තෑ හතරයි ශත විසිඑක (රු. 1,759,474.21) මුදල මත වසරකට සියයට නවයයි දශම පහ (9.5%) බැගින් 2018.10.18 වැනි දින සිට ගෙවීම නිම කරන තෙක් තවදුරටත් පොලිය ද කුමාරප්පෙරුම ආරච්චිගේ චන්දන කුමාරප්පෙරුම මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. ආර්. එන්. එල්. ගුණතිලක විසින් සහතික කරන ලද 2017.05.26 දිනැති අංක 461 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැටලක්ෂ දහහත්දහස් දහහතයි ශත තිස් දෙක (රු. 6,017,017.32) මුදල සමඟ 2018.10.18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් දඅයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, දඹදෙනිය ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ කෝරළේ, අලව්ව ප්‍රාදේශීය සභා සීමාවේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝයවලාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බෝයවලාන ග්‍රාමයේ පිහිටි "ඉහළ කොටුවේ පිල්ලෑවෙ දෑනට වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජී. එස්. හෙට්ටිආරච්චි මහතා විසින් මැන සාදන ලද 2016.11.18 දිනැති අංක 1821ඒ දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වන එනම් එකී ලොට් 1, උතුරට : ආර්. එම්. විමලාවතීගේ ඉඩම ද, නැගෙනහිරට : අංක 115/2010 දරන පිඹුරෙහි ලොට් 2 සහ 4 (ප්‍රවේශ මාර්ගය) ද, දකුණට : ඇල ද, බස්නාහිරට : බෝයවලාන පන්සල සහ ආර්. ඩී. ගුණසේකර හිමිකම් කියන පන්සලගාවහේන යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම් සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, නිවාස, ගොඩනැගිලි යනාදී සෑම සියලු දේ ද සමඟ අංක 115/2010 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා ඇති මාර්ගය පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිය ද සමඟ වේ.

ඉහත ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ කෝරළේ, අලව්ව ප්‍රාදේශීය සභා සීමාවේ දකුණු අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝයවලාන ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, බෝයවලාන ග්‍රාමයේ පිහිටි "ඉහළ කොටුවේ පිල්ලෑවෙ දූනට වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජී. එස්. හෙට්ටිආරච්චි මහතා විසින් මැන සාදන ලද 2010.06.27 දිනැති අංක 115/2010 දරන පිඹුරෙහි ලොට් 1 සඳහා එකී මිනින්දෝරු මහතා විසින් එකී පිඹුර මතම සිදු කරන ලද වර්ෂ 2011.01.08 වැනි දින දරන අනුබෙදීම ප්‍රකාරව 1ඒ, 1බී, 1සී ලෙස දක්වා ඇති අතර එකී කැබලි අංක 01ඒ, 01බී, 01සී සඳහා මායිම්, උතුරට : විමලාවතීගේ ඉඩම වෙන් කරන පැල ඉනි වැට ද, නැගෙනහිරට : අංක 115/2010 දරන පිඹුරෙහි ලොට් 2 හා 4 ද, දකුණට : ඇල ද, බස්නාහිරට : බෝයවලාන පන්සල සහ ආර්. ඩී. ගුණසේකර හිමිකම් කියන පන්සලගාවහේන නමැති ඉඩම වෙන් කරන පැල, ඉනි වැට ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.1012 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි යනාදී සෑම සියලු දේ ද සමග වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ U 92/108 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. ඒ. ඒ. සංජීව මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
දඹදෙනිය.

01 - 161

---

## ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 නොවැම්බර් මස 28 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

(ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීපා පී. වික්‍රමතිලක විසින් ලියා සහතික කරන ලද 2016 සැප්තැම්බර් මස 09 දිනැති අංක 2120 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම කොළඹ 05 සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ අංක PV 10415 දරන අංකයෙන් ලියාපදිංචි කොට යථා පරිදි සංස්ථාගත කරන ලද ජාවා ඉන්ස්ටිට්යුට් ෆෝ ඇඩ්වාන්ස්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මින්මතු මෙහි "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2018 සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී ජාවා ඉන්ස්ටිට්යුට් ෆෝ ඇඩ්වාන්ස්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී වෙත ඉහත කී අංක 2120 දරන උකස් බැඳුම්කරය මත රුපියල් හැත්තෑ හය ලක්ෂ හැත්තෑ හය දහස් හත්සිය අසූ දෙකයි ශත පනස් අටක (රු. 7,676,782.58) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හැත්තෑ ලක්ෂ දහ නව දහස් අටසිය අසූ හතරයි ශත තුනක (රු. 7,019,883.03) මුදල මත සෑම මාසයකම වැඩකරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR LAST WEEK MONTHLY SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද.

තව ද, එකී මුදල වන රුපියල් හැත්තෑ හය ලක්ෂ හැත්තෑ හය දහස් හත්සිය අසූ දෙකයි ශත පනස් අටක (රු. 7,676,782.58) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දනය දක්වා රුපියල් හැත්තෑ ලක්ෂ දහ නව දහස් අටසිය අසූ හතරයි ශත තුනක (රු. 7,019,884.03) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR LAST WEEK MONTHLY SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉෂාන්ත සිරිබද්දන යන අය විසින් ඉහත කී අංක 2120 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල, තුසිත් කරුණාරත්න, කොළඹ බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැංක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

#### අංක 2120 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා බලසීමාව තුළ අංක 96B ගල්වඩුගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඹවැල්ල ගමේ පිහිටි වක්වැල්ල පාරේ වරිපනම් අංක 273 දරන ගස්හැටේවත්ත අද්දර ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු

බී. ජී. බන්ධුතිලක විසින් මැන සාදන ලද 2016.07.06 දිනැති අංක 33395/2016 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : සිමෙන්ති කණුව, අංක 45A පිඹුරේ ලොට් D, අංක 233 පිඹුරේ ලොට් 3 සහ අංක 45A පිඹුරේ ලොට් A ද, නැගෙනහිරට : අංක 45A පිඹුරේ ලොට් A සහ ගස්හැටේවත්ත අද්දර ඕවිට (වරිපනම් අංක 271 සිට 271/5) ද, දකුණට : ගස්හැටේවත්ත අද්දර ඕවිට (වරිපනම් අංක 271 සිට 271/5) සහ කැපූ ඇල ද සහ බස්නාහිරට : කැපූ ඇල සහ සිමෙන්ති කාණුව ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි පහයි දශම හයයි හයක් (අ. 0, රූ. 0, පර්. 25.66) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සෑම සියලු දේ ද වේ.

ඉහත කී ලොට් 1 පහත විස්තර කරනු ලබන ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් වේ.

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා බලසීමාව තුළ අංක 96B ගල්වඩුගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඹවැල්ල ගමේ පිහිටි වක්වැල්ල පාරේ වරිපනම් අංක 273 දරන ගස්හැටේවත්ත අද්දර ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කේ. විජේරත්න විසින් මැන සාදන ලද 2007.08.04 දිනැති අංක 45 දරන පිඹුරේ ලොට් B වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් D, අංක 233 පිඹුරේ ලොට් 3 සහ මෙම පිඹුරේ ලොට් A ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් A සහ ගස්හැටේවත්ත අද්දර ඕවිට (වරිපනම් අංක 271 සිට 271/5) ද, දකුණට : ගස්හැටේවත්ත අද්දර ඕවිට (වරිපනම් අංක 271 සිට 271/5) සහ ලොට් C ද සහ බස්නාහිරට : ලොට් C සහ D අංක 233 පිඹුරේ ලොට් 3 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම අටයි තුනක් (අ. 0, රූ. 0, පර්. 12.83) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සෑම සියලු දේ ද වේ.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා බලසීමාව තුළ අංක 96B ගල්වඩුගොඩව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඹවැල්ල ගමේ පිහිටි වක්වැල්ල පාරේ වරිපනම් අංක 273 දරන ගස්හැටේවත්ත අද්දර ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කේ. විජේරත්න විසින් මැන සාදන ලද 2007.08.04 දිනැති අංක 45 දරන පිඹුරේ ලොට් C වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : සිමෙන්ති කණුව සහ මෙම පිඹුරේ ලොට් D ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් D, සහ ලොට් B ද සහ ගස්හැටේවත්ත අද්දර ඕවිට (වරිපනම් අංක 271 සිට 271/5) ද, දකුණට : ගස්හැටේවත්ත අද්දර ඕවිට (වරිපනම් අංක 271 සිට 271/5) සහ කැපූ ඇල ද සහ බස්නාහිරට : කැපූ ඇල සහ සිමෙන්ති කාණුව ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම අටයි තුනක් (අ. 0, රූ. 0, පර්. 12.83) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සෑම සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු එම්. කේ. විජේරත්න විසින් මැන සාදන ලද 2007.08.04 දිනැති අංක 45 දරන පිඹුරේ ලොට් D සහ බලයලත් මිනින්දෝරු ටී. ජේ. අරඹේවෙල විසින් මැන සාදන ලද 1986.03.22 දිනැති අංක 233 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් ලකුණු කරන ලද කොටස්වලින් වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01 - 138

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018 ක්වූ නොවැම්බර් මස 27 වැනි දින පැවැත්වූ රැස්වීමේ දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. එන්. හෙට්ටිආරච්චි (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.01.05 දිනැති අංක 3378 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුරුණෑගල, දකුණු වටරවුම් පාර, අංක 82 දරන ස්ථානයේ සිය ප්‍රධාන ව්‍යාපාරික කාර්යාලය පිහිටි සහ කුරුණෑගල කොට්ඨාස ලේකම් කාර්යාලයේ 2015.07.23 දිනැති අංක 01/3426 දරන සහතිකය යටතේ වයඹ පළාතේ, සහකාර පළාත්බද ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් යටතේ ඩී. ජී. කාර් සේල් යන නාමය, විලාසය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස කටයුතු කරගෙන යන දෙදෙනාම කුරුණෑගල, දකුණු වටරවුම පාර, අංක 82 දරන ස්ථානයේ පදිංචි අකලංක හියරපිටිය (ණයට ගන්නා I) සහ දීපා ප්‍රියදර්ශනී හිරපිටිය හෙවත් දීපා ප්‍රියදර්ශනී ප්‍රේමචන්ද්‍ර (ණයට ගන්නා II) සහ කුරුණෑගල දකුණු වටරවුම පාර අංක 82 දරන ස්ථානයේ පදිංචි විදානගේ සෙනරත් හියරපිටිය (ණයට ගන්නා III) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද, ණයට ගන්නා I විසින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම්, හිමිකම් හා බලපුළුවන්කාරකම් එකී අංක 3378 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2018 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් දොළොස් මිලියන දෙලක්ෂ තිස්හයදහස් අටසිය විසිතුනයි ශත හැටපහක (රු. 12,236,823.65) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී රුපියල් දොළොස් මිලියන දෙලක්ෂ තිස්හයදහස් අටසිය විසිතුනයි ශත හැටපහක (රු. 12,236,823.65) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2018 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 3378 දරන උකස් බැඳුම්කරය යටතේ සුරැකුම් කරන ලද එකී අංක 3378 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින පහත සඳහන් මුදල්වල එකතුව රුපියල් නව මිලියන හාරලක්ෂ පනස්හතරදහස් එකසිය අසූහතයි ශත හැටඅටක (රු. 9,454,187.68) මුදල මත පහත සඳහන් අනුපාතිකය යටතේ, එනම්:-

(i) රුපියල් හය මිලියන තුන්ලක්ෂ විසිඑක්දහස් එකසිය හැත්තෑපහක (රු. 6,321,175.00) මුදල මත වසරකට 17.2% ක පොළිය ද,

(ii) රුපියල් එක් මිලියන හාරලක්ෂ හැත්තෑපන්දහස් පන්සිය තිහක (රු. 1,475,530.00) මුදල මත වසරකට 17.3%ක පොළිය ද,

(iii) රුපියල් එක් මිලියන තුන්ලක්ෂ අනූහත්දහස් හතලිස් හතරයි ශත අනූඑකක (රු. 1,397,044.91) මුදල මත වසරකට 16.7% ක පොළිය ද,

(iv) රුපියල් දෙලක්ෂ හැටදහස් හාරසිය තිස්හතයි ශත හැත්තෑහතක (රු. 260,437.77) මුදල මත වසරකට 17.95%ක පොළිය ද,

ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම්ද, ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතෙක් සිය ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී අංක 3378 දරන බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල වලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

**ඉහත සඳහන් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වෑඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගංදහය කෝරළේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ කුරුණෑගල දකුණ අංක 841 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු වටරවුම් පාර, වරිපනම් අංක 82 දරන සනිසයිඩ් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ජී. එස්. ගලගෙදර විසින් සාදන ලද 2014 මාර්තු 14 දිනැති පිඹුරු අංක 10756 හි ලොට් 1 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : වටරවුම් පාරෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 3050 හි ලොට් B වලින් ද, දකුණට : පිඹුරු අංක 1156 හි ලොට් 3 න් ද, බටහිරට : පාර (මහනගර සභා) සහ ප්‍රමාණයෙන් පිඹුරු අංක 10756 ට අනුව පර්චස් විස්සක් (අ.0, රූ.0, පර්.20) වන අතර එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද සමග වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 46/98 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ලොට් 1 පහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වෑඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගංදහය කෝරළේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ කුරුණෑගල දකුණ අංක 841 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු වටරවුම් පාර, වරිපනම් අංක 82 දරන සනිසයිඩ් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එස්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1966 අගෝස්තු මස 08 වැනි දින දරන අංක 3050 දරන පිඹුරෙහි ලොට් A ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටසට උතුරට : වටරවුම් පාරෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 3050 හි ලොට් B වලින් ද, දකුණට : පිඹුරු අංක 1156 හි ලොට් 3 න් ද, බටහිරට : පාර, ප්‍රමාණයෙන් පිඹුරු අංක 3050ට අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) වන අතර එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද සමග වේ.

ඉහත කී ඉඩම මත ස්ථිර ලෙසම සවි කර ඇති හෝ තබා අති සහ කලින් කල ගෙන එනු ලබන සෑම සහ සියලු ආකාරයකම නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ඇමුණුම් සහ සේවා සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ, උපකරණ සහ වායු සමීකරණ උපකරණ ද ඇතුළුව වේ.

අධ්‍යක්ෂ මණ්ඩල නියෝගය පරිදි,

සමාගම් ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

01 - 66

---

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018 ක්වූ නොවැම්බර් මස 27 වැනි දින පැවැත්වූ රැස්වීමේ දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් බෙන්තොට ප්‍රසිද්ධ නොතාරිස් හර්ෂනී සිරිමාන්න (මහත්මිය)

විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.06.21 දිනැති අංක 153 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගනේගොඩ, ගොලුවමුල්ල, "හේමාලි" දරන ස්ථානයේ පදිංචි ඕපාත කංකානම්ගේ දොන් ධනසිරි ඩයස් (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද, ණයට ගන්නා විසින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම්, හිමිකම් හා බලපුළුවන්කාරකම් එකී අංක 153 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුවට උකස්කර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2018 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් දොළොස් මිලියන පනස් හය දහස් හත්සිය අනූ හයයි ශත තිස් එකක (රු. 12,056,796.31) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී රුපියල් දොළොස් මිලියන පනස් හය දහස් හත්සිය අනූ හයයි ශත තිස් එකක (රු. 12,056,796.31) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2018 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා සහ එකී අංක 153 දරන උකස් බැඳුම්කරය යටතේ සුරැකුම් කරන ලද එකී අංක 153 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් නව මිලියන අටලක්ෂ හැටඑක්දහස් එකසිය දොළහක (රු. 9,861,112.00) මුදල මත වසරකට සියයට දහනවයයි දශම දෙකයි පහක (19.25%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම්ද, ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම්ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

**ඉහත සඳහන් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලේබොඩ පත්තුවේ, මන්දකන්ද, අංක 92B ග්‍රාම සේවා කොට්ඨාසයේ, කරන්දෙනිය ප්‍රාදේශීය සභා සීමාව තුළ වූ කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරන්දෙනිය මන්දකන්ද පිහිටි බෙලිගහකුඹුර බස්නාහිර දෙනිය මන්නාද්දර වත්ත, බෙලිගහකුඹුර දෙනිය වඩියාද්දර කුඹුර, ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩමෙහි යාබදව පිහිටි ඉඩම් කොටස් හය වන ලොට් $1^A$, $1^B$, $1^C$, $1^D$ සහ $1^E$ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස් බලයලත් මානක එම්. තේජසිරි විසින් සාදන ලද 2014.04.08 දිනැති අංක 1661 දරන පිඹුරෙහි ලොට් A ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස, උතුරට : පීඑස් පාරෙන් ද, නැගෙනහිරට : උස් පාරෙන් ද, දකුණට : පිඹුරු අංක 1646 හි ලොට් $1^G$ වලින් ද, බටහිරට : කාණුවකින් වෙන්වන රජයේ ඉඩමකින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටක් (අ. 0, රූ. 1, පර්. 28) වන අතර එහි පිහිටි ගොඩනැගිලි ද සමග වේ. මෙය ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J 131/12 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම මත ස්ථිර ලෙසම සවි කර ඇති හෝ තබා ඇති සහ කලින් කල ගෙන එනු ලබන සෑම සහ සියළු ආකාරයකම නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවි කිරීම්, ඇමුණුම් සහ සේවා සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ ද ඇතුළුව වේ.

අධ්‍යක්ෂ මණ්ඩල නියෝගය පරිදි,

සමාගම් ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

01 - 67

---

**අමානා බැන්ක් පීඑල්සී PB 3618 PQ - මාවනැල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය.

CIF අංකය : 255938.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තිය යටතේ අමානා බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය 2018 ජූලි මස 21 වැනි දින පවත්වන ලද ස්වකීය රැස්වීමේ දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන්ම සහ ඒකමතිකව යෝජනා සම්මත කරනු ලැබූ බව අමානා බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද බැංකු සමාගමක් වන ලියාපදිංචි අංක PB3618PQ දරන අමානා බැන්ක් පී.එල්.සී. වෙනුවෙන් මාවනැල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අනිස්ඩීන් විසින් සහතික කරන ලද 2016.03.31 වැනි දින අංක 895 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "බන්ධනදායීන්" යනුවෙන් සඳහන් කරනු ලබනු

නිසාර් මොහොමඩ් නිස්ලාන් මහතා සහ නිසාර් මොහොමඩ් නිසාකීර් මහතා යන අය විසින් පැහැරහැර ඇති හෙයින් ද, දැනට 2017 දෙසැම්බර් 30 වැනි දින වන විට එකී උකස් බැඳුම්කරය මත අමානා බැන්ක් පී.එල්.සී. වෙත රුපියල් මිලියන දහතුනයි හත්ලක්ෂ අසූ දෙදහස් පන්සිය හැට නවයක් වූ මුදලක් (රු. 13,782,569.00) ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර) ඇත්නම් එම ගෙවීම අඩු කිරීමෙන් පසුව දරන ලද සියලු ප්‍රචාරක පිරිවැය වෙනත් පිරිවැය සහ ගාස්තු ද සමග 2018 ජනවාරි 01 දින සිට වෙන්දේසි දිනය තෙක් වාර්ෂිකව සියයට දහසයක් (16%) වූ අනුපාතිකයක් යටතේ ලාභය/ලාභ එකතුව/ කුලී වාරික සමග එකී රුපියල් මිලියන දහතුනයි හත්ලක්ෂ අසූ දෙදහස් පන්සිය හැට නවයක් වූ මුදලක් (රු. 13,782,569.00) අය කර ගැනීම සඳහා මාවනැල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අනිස්ඩීන් විසින් ලියා සහතික කරන ලද 2016.03.31 වැනි දින අංක 895 දරන බැඳුම්කරයේ උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති මෙහි සඳහන් සහ අමානා බැන්ක් පී. එල්. සී. වෙත උකස් කරන ලද දේපළ වරලත් වෙන්දේසිකාර, තක්සේරුකාර සහ උසාවි කොමසාරිස් අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අමානා බැන්ක් පී.එල්.සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාදුරේ කෝරලේ, වැවුඩවිල්ලි හත්පත්තුවේ, රිදීගම ප්‍රාදේශීය සභා සීමාව තුළ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩිතියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නැබිරිවත්ත, හිරිකැටේ සහ මඩිතියාව ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද සමග "කාලේස්වරීවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඒ. බී. එම්. වෙබර් විසින් සාදන ලද 1981 දෙසැම්බර් 08 දින අංක 716 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 03, 04, 05, 06, 07, 08, 09, 10, 11, 12, 13, 14 සහ 15 ලෙස ලකුණු කර ඇත්තා වූ ද එම කොටස් සියල්ල සමස්ථයක් ලෙස ගත් කළ, උතුරට : වික්ටර් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ එකී පිඹුරේ ලොට් අංක 02 දරන කොටස ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 02 සහ පාර ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ද, බටහිරට : පී. සුබයා සහ කලුබණ්ඩා යන අය විසින් හිමිකම් කියන ඉඩම ද යන මායිම් තුළ පිහිටි එකී අංක 716 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර අටයි පර්චස් තිස් එකක් වූ ද (අ. 8, රූ. 0, පර්. 31) කුරුණෑගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ L 14/04 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති යාබද ඉඩම් කොටස් වේ.

රිදීගම බලයලත් මිනින්දෝරු ඒ. එම්. ජේ. බණ්ඩාර විසින් සාදන ලද මෑතකාලීන මිනුමකට අනුව, එකී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර ඇත. එනම්,

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාදුරේ කෝරලේ, වැවුඩවිල්ලි හත්පත්තුවේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩිතියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැබිරිවත්ත, හිරිකැටේ සහ මඩිතියාව ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද සමග "කාලේස්වරීවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා රිදීගම බලයලත් මිනින්දෝරු ඒ. එම්. ජේ. බණ්ඩාර විසින් සාදන ලද 2015 නොවැම්බර් 13 වැනි දින අංක 1728 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 ලෙස ලකුණු කර ඇත්තා වූ ද උතුරට : වික්ටර් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ අංක 716 දරන පිඹුරේ ලොට් අංක 02 ද, නැගෙනහිරට : ප්‍රධාන පාරේ සිට නිවස්වලට වැටී ඇති පාර ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ද, බටහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද එකී අංක 1728 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර හතයි රූඩ් දෙකයි පර්චස් විස්සක් (අ. 7, රූ. 2, පර්.20) හෙවත් හෙක්ටයාර් 3.0858ක් වූ කුරුණෑගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ L 14/111 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති යාබද ඉඩම් කොටස් වේ.

(සංස්ථාගත තක්සේරුකාර) ආර්. එම්. ඩබ්. එන්. කේ. චන්ද්‍රසේකර විසින් 2018 මාර්තු 14 දින සිදු කළ තක්සේරුවට අනුව අවම ලංසුව රු. 25,000,000.00 (රුපියල් මිලියන විසිපහක්) ලෙස නියම කර ඇත.

ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ දී ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයට අත්සන් කිරීම සඳහා අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ ප්‍රතිකර්ම ඒකකයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර රිසා ඉස්මයිල් මහතාට බලය පවරන ලෙස ද තවදුරටත් යෝජනා සම්මත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රිසා ඉස්මයිල්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු අයකිරීම් අංශය.

01 - 115

---

### අමානා බැන්ක් පීඑල්සී PB 3618 PQ - පිටකොටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය.

CIF අංකය : 279767.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තිය යටතේ අමානා

බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය 2018 ජූලි මස 21 වැනි දින පවත්වන ලද ස්වකීය රැස්වීමේ දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන්ම සහ ඒකමතිකව යෝජනා සම්මත කරනු ලැබූ බව අමානා බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද බැංකු සමාගමක් වන ලියාපදිංචි අංක PB3618PQ දරන අමානා බැන්ක් පී.එල්.සී. වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සුලානි එෆ්. දයාරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1146 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "බන්ධනදායී" යනුවෙන් සඳහන් කරනු ලබනු "ටයිල් සෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට 2018 ජනවාරි 19 වැනි දින වන විට එකී උකස් බැඳුම්කරය මත අමානා බැන්ක් පී.එල්.සී. වෙත රුපියල් මිලියන දහ අටයි හත්ලක්ෂ හැත්තෑ හත් දහස් එකසිය දාහතරයි ශත තිස් අටක් වූ මුදලක් (රු. 18,777,114.38) ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර) ඇත්නම් එම ගෙවීම අඩු කිරීමෙන් පසුව දරන ලද සියලු ප්‍රචාරක පිරිවැය වෙනත් පිරිවැය සහ ගාස්තු ද සමග 2018 ජනවාරි 20 දින සිට වෙන්දේසි දිනය තෙක් වාර්ෂිකව සියයට දහසයක් (16%) වූ අනුපාතිකයක් යටතේ ලාභය/ලාභ එකතුව/ කුලී වාරික සමග එකී රුපියල් මිලියන දහ අටයි හත්ලක්ෂ හැත්තෑ හත් දහස් එකසිය දාහතරයි ශත තිස් අටක් වූ මුදලක් (රු. 18,777,114.38) අය කර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සුලානි එෆ්. දයාරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1146 දරන එකී උකස් බැඳුම්කරයේ උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති මෙහි සඳහන් සහ අමානා බැන්ක් පී. එල්. සී. වෙත උකස් කරන ලද දේපළ වරලත්, වෙන්දේසිකාර, තක්සේරුකාර සහ උසාවි කොමසාරිස් ෂොක්මන් සහ සමරවික්‍රම යන මහත්වරුන් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, නැගෙනහිර කව්ඩාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නිකපේ, ශ්‍රීමත් සෝමානන්ද පාර යන ලිපිනයේ පිහිටා ඇත්තා වූ ද, දැන් 25/1, ශ්‍රීමත් සෝමානන්ද පාර යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද (කලින්) වරිපනම් අංක 25A දරන පදිංචි ගොඩනැගිලි සමග "කෙටකෙලගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජී. ඕ. ආර්. සිල්වා විසින් සාදන ලද 1976 අප්‍රේල් 20 වැනි දින අංක 155 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක B2 ලෙස ලකුණු කර ඇති උතුරට : කේ. ඒ. පියසේන යන අයගේ ඉඩම ද (ලොට් A), නැගෙනහිරට : කේ. ඒ. පියසේන යන අයගේ ඉඩම ද, (ලොට් A), දකුණට : ලොට් E ලෙස ලකුණු කරන ලද මාර්ග රක්ෂිතය ද, බටහිරට : එකී අංක 155 දරන පිඹුරේ ලොට් B1 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ එකී අංක 155 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම එකයි දෙකක් වූ ද (අ. 0, රූ. 0, පර්. 7.12) දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ F 239/43 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස් වේ.

බලයලත් මිනින්දෝරු ආර්. සී. දිසානායක විසින් සාදන ලද 1965 ජූනි 02 දින අංක 1621 දරන පිඹුරේ නිරූපිත ලොට් B සහ D දරන ඒකාබද්ධ කරන ලද කොටස්වල උපබෙදීමක් වන අංක 155 දරන පිඹුරේ එකී ලොට් B2 දරන කොටස කොළඹ දිසා අධිකරණයේ අංක 6505/P දරන නඩුවේ නඩු වාර්තාවේ ගෙනුකර ඇත.

ඉහත කී අංක 155 දරන පිඹුරේ ලොට් E ලෙස නිරූපිත මාර්ගය සඳහා වෙන් කළ කොටස හරහා සහ ඔස්සේ යාම ඒමේ අයිතිය ද ඊට ඇතුළත් වේ.

වරලත් තක්සේරුකරු, මිනින්දෝරු පී. පී. ටී. මොහිදීන් විසින් 2018 ජූලි 09 වැනි දින සිදු කළ තක්සේරුවට අනුව අවම ලංසුව රු. 19,000,000.00 (රුපියල් මිලියන දහනවයයි) ලෙස නියම කර ඇත.

ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ දී ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයට අත්සන් කිරීම සඳහා අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ ප්‍රතිකර්ම ඒකකයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර රිසා ඉස්මයිල් මහතාට බලය පවරන ලෙස ද තවදුරටත් යෝජනා සම්මත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රිසා ඉස්මයිල්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු අයකිරීම් අංශය.

01 - 114

---

### අමානා බැන්ක් පීඑල්සී PB 3618 PQ - කල්මුණේ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය.

CIF අංකය : 275896.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තිය යටතේ අමානා බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය 2018 අගෝස්තු 18 වැනි දින පවත්වන ලද ස්වකීය රැස්වීමේ දී පහත දැක්වෙන පරිදි

විශේෂයෙන්ම සහ ඒකමතිකව යෝජනා සම්මත කරනු ලැබූ බව අමානා බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද බැංකු සමාගමක් වන ලියාපදිංචි අංක PB 3618 PQ දරන අමානා බැන්ක් පී.එල්.සී. වෙනුවෙන් කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. බදුර්දීන් විසින් ලියා සහතික කරන ලද 2017.02.09 දින අංක 7266 දරන උකස් බැඳුම්කරය සහ 2016.11.15 වැනි දින අංක 7213 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම බන්ධනදායීන් යනුවෙන් සඳහන් කරනු ලබන උතුමාලෙබ්බෙ මොහොමඩ් නජාත් මහතා සහ මොහිදීන් බාවා ෆාතිමා ජුමානා මහත්මිය යන අය විසින් පැහැරහැර ඇති හෙයින්ද, දැනට 2018 පෙබරවාරි 28 දින වන විට එකී උකස් බැඳුම්කර මත පිළිවෙලින් අමානා බැන්ක් පී. එල්. සී. වෙත රුපියල් මිලියන එකොළහයි පන්ලක්ෂ අසූ දෙදහස් හාරසිය දහනවයයි ශත පනස් හතක් වූ මුදලක් (රු. 11,582,419.57) සහ රුපියල් මිලියන හතයි නව ලක්ෂ පනස් දෙදහස් නවසිය තිස්හතරයි ශත පනස් හතක් වූ මුදලක් (රු. 7,952,934.57) ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර) ඇත්නම් එම ගෙවීම අඩු කිරීමෙන් පසුව දරන ලද සියලු ප්‍රචාරක පිරිවැය වෙනත් පිරිවැය සහ ගාස්තු ද සමග 2018 මාර්තු 01 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් වාර්ෂිකව සියයට දහසයක් (16%) වූ අනුපාතිකයක් යටතේ ලාභය/ලාභ එකතුව/ කුලී වාරික සමග එකී රුපියල් මිලියන එකොළහයි පන්ලක්ෂ අසූ දෙදහස් හාරසිය දහනවයයි ශත පනස් හතක් වූ මුදලක් (රු. 11,582,419.57) සහ රුපියල් මිලියන හතයි නව ලක්ෂ පනස් දෙදහස් නවසිය තිස්හතරයි ශත පනස් හතක් වූ මුදලක් (රු. 7,952,934.57) අය කර ගැනීම සඳහා කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. බදුර්දීන් විසින් සහතික කරන ලද අංක 7266 සහ 7213 දරන එකී උකස් බැඳුම්කරය පළමු උපලේඛනයේ සහ දෙවන උප ලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති මෙහි සඳහන් සහ අමානා බැන්ක් පී. එල්. සී. වෙත උකස් කරන ලද දේපළ වෙන්දේසිකාර, තක්සේරුකාර සහ උසාවි කොමසාරිස් අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

**පළමු උපලේඛනය**

**1 වන ඉඩම**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, නින්තාවූර් පත්තුවේ, නින්තාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ වූ නින්තාවූර් ප්‍රාදේශීය සභා සීමාව තුළ අඩ්ඩපල්ලාම් 22- නින්තාවූර් ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නින්තාවූර් ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද TP අංක 49222 හි සඳහන් සහ බලයලත් මිනින්දෝරු එන්. සන්මුගම් විසින් සාදන ලද අංක 34/1954 දරන පිඹුරේ නිරූපිත "අරසාදිතොට්ටම්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ වයඹ කොටසින් ලබාගත් ලොට් අංක 17 සහ 18 දරන කොටස් සංයුක්ත වන්නා ඉඩමේ උතුරට : අහමඩ් ලෙබ්බෙ සීනි මොහොමඩ් සහ වෙනත් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : එම්. මුස්තාපා යන අයගේ ඉඩම ද, දකුණට : ලොට් අංක 16 ද, බටහිරට : පාර ද (RDA) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකක් වූ (අ. 1, රූ. 0, පර්. 0) බෙදා වෙන් කරන ලද දකුණු අර්ධ බිම් කොටස් වේ. මෙම සම්පූර්ණ ඉඩම එහි අඩංගු වෙනත් සියලු දේ ද සමග කල්මුණේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ L 52/201 දරන වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇත.

**2 වන ඉඩම**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, නින්තාවූර් පත්තුවේ, නින්තාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ වූ නින්තාවූර් ප්‍රාදේශීය සභා සීමාව තුළ අඩ්ඩපල්ලාම් 22- නින්තාවූර් ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නින්තාවූර් ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද TP අංක 49222 හි සඳහන් සහ බලයලත් මිනින්දෝරු එන්. සන්මුගම් විසින් සාදන ලද අංක 34/1954 දරන පිඹුරේ නිරූපිත "අරසාදිතොට්ටම්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ වයඹ කොටසින් ලබාගත් ලොට් අංක 13, 14, 15 සහ 16 දරන කොටස් සංයුක්ත වන්නා වූ ඉඩමේ මධ්‍යම කොටසේ දකුණු කොටසින් ලබාගත් උතුරට : අහමඩ් ලෙබ්බෙ සීනි මොහොමඩ් සහ වෙනත් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : එම්. මුස්තාපා යන අයගේ ඉඩම ද, දකුණට : ඉස්මේල් යන අයගේ ඉඩම ද; බටහිරට : එම ඉඩමේම ඉතිරි කොටස් ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට අඩි අසූ තුනක් ද (83), නැගෙනහිර සිට බටහිරට අඩි එකසිය හතලිස් දෙකක් ද (142) වූ ඉඩමේ දකුණු කොටසේ පිහිටි බෙදා වෙන්කරන ලද බිම් කොටස් වේ. මෙම සම්පූර්ණ ඉඩම එහි අඩංගු වෙනත් සියලු දේද සමග කල්මුණේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ L 11/116 දරන වෙළුමේ /පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

එකී ඉඩම් කොටස් දෙක එකිනෙකට ඒකාබද්ධව එක් තනි ඒකකයක් ලෙස පවතින අතර බලයලත් මිනින්දෝරු එස්. එම්. ඉබ්‍රාහීම් විසින් සාදන ලද 2017 ජනවාරි 27 වැනි දින අංක 506 දරන පිඹුරේ දැක්වෙන මෑතකාලීන මිනුම් සහ විස්තරය අනුව එම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර වේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, නින්තාවූර් පත්තුවේ, නින්තාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ වූ නින්තාවූර් ප්‍රාදේශීය සභා සීමාව තුළ අඩ්ඩපල්ලාම් 22- නින්තාවූර් ග්‍රාම නිලධාරි ග්‍රාමයේ ප්‍රධාන මාර්ගයේ (RDA) ඔස්සේ පිහිටා ඇත්තා වූ ද, "අරිසාදිතොට්ටම්" යනුවෙන් හඳුන්වනු ලබන, උතුරට : අහමඩ් ලෙබ්බෙ සීනි මොහොමඩ් සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : වර්තමානයේ පටුමග ද, දකුණට : වර්තමානයේ දී මොහොමඩ් අලි විසින් හිමිකම් කියන ඉඩම ද, බටහිරට : ප්‍රධාන මාර්ගය ද (RDA) යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් තිස් හයයි දශම දෙකයි හතරක් (අ. 1, රූ. 0, පර්. 36.24) හෙවත් හෙක්ටයාර් 0.49648 ක් වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස් වේ. මෙම සම්පූර්ණ ඉඩම සඳහා එහි අන්තර්ගත වෙනත් සියලු දේද ඇතුළත් වේ.

සංස්ථාගත තක්සේරුකාර ජේ. එස්. එම්. අයි. බී. කරුණාතිලක විසින් සාදන ලද 2018 ජූලි මස 30 වැනි දින දරන තක්සේරුවට අනුව අවම ලංසුව රු. 35,000,000.00 (රුපියල් මිලියන තිස් පහක්) ලෙස නියම කර ඇත.

### දෙවන උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කරෙයිවාහු පත්තුවේ, කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ වූ කල්මුනේ මහනගර සභා සීමාව තුළ කල්මුනේ - 06, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කල්මුනේකුඩි ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "සින්වලාවූ" යනුවෙන් හඳුන්වනු ලබන (උතුරේ සිට දකුණට බඹ 13, නැගෙනහිර සිට බටහිරට බඹ 10 ප්‍රමාණයෙන් යුත්) ඉඩම් කොටසින් උතුරට : සහිබු පාර ද, නැගෙනහිරට : පටුමග ද, දකුණට : අතම්බාවා නසීමා යන අයගේ ඉඩම ද, බටහිරට : ඉඩම ද යන මායිම් තුළ පිහිටා ඇත්ත වූද ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට බඹ හයහමාරක් ද (6 1/2), නැගෙනහිර සිට බටහිරට බඹ දහයක් (10) ද වන බෙදා වෙන් කරන ලද උතුරු දිශාවේ පිහිටි ඉඩම් කොටස වේ. මෙහි අන්තර්ගත සියලු දේද සමග සම්පූර්ණ ඉඩම කල්මුනේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ K 241/73 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මිනින්දෝරු අහමඩ් එම්. මහරූෆ් විසින් සාදන ලද 2016 සැප්තැම්බර් මස 01 වැනි දින අංක 552/16 දරන මෑත කාලීන මැනීම සහ විස්තරය අනුව එකී ඉඩම් කොටස පහත දැක්වෙන පරිදි විස්තර වේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කරෙයිවාහු පත්තුවේ, කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ වූ කල්මුනේ මහනගර සභා සීමාව තුළ කල්මුනේ - 06, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කල්මුනේකුඩි ග්‍රාමයේ සහිබු පාර යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ "සින්වලාවූ" යනුවෙන් හඳුන්වනු ලබන උතුරට : සහිබු පාර ද, නැගෙනහිරට : පෞද්ගලික පාර ද, දකුණට : අතම්බාවා නසීමා යන අය විසින් හිමිකම් කියන ඉඩම ද, බටහිරට : පෞද්ගලික පාර ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 7.20) හෙවත් හෙක්ටයාර් 0.0182ක් වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වේ. මෙම සමස්ථ ඉඩම සඳහා ඒ තුළ පිහිටි වෙනත් සියලු දේ ද ඇතුළත් වේ.

සංස්ථාගත තක්සේරුකාර ජේ. එස්. එම්. අයි. බී. කරුණාතිලක විසින් සාදන ලද 2018 ජූලි මස 30 වැනි දින දරන තක්සේරු කිරීමට අනුව අවම ලංසුව රු. 10,800,000.00 (රුපියල් මිලියන දහයයි ලක්ෂ අටක්) ලෙස නියම කර ඇත.

ඉහත කී යෝජනා සම්මතය ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ දී එයට අත්සන් කිරීම සඳහා අමානා බැන්ක් පී. එල්. සී. ආයතනයේ ප්‍රතිකර්ම ඒකකයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර රිසා ඉස්මයිල් මහතාට බලය පවරන ලෙස ද තවදුරටත් යෝජනා සම්මත කරන ලදී

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රිසා ඉස්මයිල්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු අයකිරීම් අංශය.

01 - 113

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 නොවැම්බර් මස 28 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. ආරියරත්න විසින් ලියා සහතික කරන ලද 2015.12.22 දිනැති අංක 10980 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම දංඕවිට තෙන්නකෝන් මුදියන්සේලාගේ තිස්ස බණ්ඩාර තෙන්නකෝන් සහ හකුරු කුඹුරලාගේ කල්‍යාණි පුෂ්පලතා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2018 සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී තෙන්නකෝන් මුදියන්සේලාගේ තිස්ස බණ්ඩාර තෙන්නකෝන් සහ හකුරු කුඹුරලාගේ කල්‍යාණි පුෂ්පලතා යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 10980 දරන උකස් බැඳුම්කරය මත රුපියල් එක් කෝටි දහ තුන් ලක්ෂ හතළිස් පන් දහස් දෙසිය විසි දෙකයි ශත හැට එකක (රු. 11,345,222.61) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි නව ලක්ෂ විසි තුන් දහස් පන්සිය අනූවයි ශත පනස් හතක (රු. 10,923,590.57) මුදල මත සෑම වර්ෂයකම මාස තුනකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් එක් කෝටි දහ තුන් ලක්ෂ හතළිස් පන් දහස් දෙසිය විසි දෙකයි ශත හැට එකක (රු. 11,345,222.61) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි නව ලක්ෂ විසි තුන් දහස් පන්සිය අනූවයි ශත පනස් හතක (රු. 10,923,590.17) මුදල මත සෑම වර්ෂයකම මාස තුනකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද හෝ විකිණීමේ දිනය

අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ ඉහත කී උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා තෙන්නකෝන් මුදියන්සේලාගේ තිස්ස බණ්ඩාර තෙන්නකෝන් යන අය විසින් ඉහත කී අංක 10980 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල, අයි. ඩබ්ලිව්. ජයසූරිය, මහනුවර බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 10980 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කිරවැලි පත්තුවේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 92E වරකාපොල නගර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිලන්දුව ගමේ පිහිටි "අම්බලන්ඕවිටවත්ත, වැල්ලගහවත්ත සහ වැලිකෙලියේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. එම්. බී. ජයකොඩි විසින් සාදන ලද 2015.09.19 දිනැති අංක 2015/455 දරන මැනුම් පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : වැලිකෙලියේ කුඹුර ද, නැගෙනහිරට : ආර්. බී. ජිනසෝම, එච්. කේ. පොඩිනේරිස් සහ එම්. කේ. එස්. ප්‍රියදර්ශනී යන අයගේ ඉඩම ද, දකුණට : එම්. කේ. එස්. ප්‍රියදර්ශනී, මිස්ලින් සහ වෙනත් අයගේ ඉඩම සහ ඇත්තාවල එස්ටේට් ද සහ බස්නාහිරට : ලොට් 1 ඉතිරි කොටස සහ ලොට් 2 සහ මගේ අංක 2015/454 පිඹුරේ ලොට් 1 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 37.60) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි නවයයි හයයි තුනක් (හෙක්. 0.1963) විශාල ඉඩම සහ එහි පිහිටි ස්ථිර ගොඩනැගිල්ල සහ අනෙකුත් සෑම සියලු දේ ද වේ.

ඉහත ඉඩම පහත් විස්තර කරනු ලබන ඉඩමේ උප බෙදීමකි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කිරවැලි පත්තුවේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 92E වරකාපොල නගර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිලන්දුව ගමේ පිහිටි "අම්බලන්ඕවිටවත්ත, වැල්ලගහවත්ත සහ වැලිකෙලියේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2005.07.06 දිනැති අංක 5110 දරන මැනුම් පිඹුරේ ලොට් 1 වශවෙන් ලකුණු කොට ෙබද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. කේ. සේදිරිස් හිමිකම් කියන වැලිකෙලියේ කුඹුර ද, නැගෙනහිරට : එච්. කේ. පොඩිනේරිස් සහ තවත් අය හිමිකම් කියන වැලිකෙලියේපහළවත්ත ද, දකුණට : රජය හිමිකම් කියන ඇත්තාවල එස්ටේට් ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු සී. කුරුකුලසූරියගේ අංක 801 දරන පිඹුරේ ලොට් 5 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහයක් (අ. 0, රූ. 2, පර්. 10) විශාල ඉඩම සහ එහි පිහිටි ස්ථිර ගොඩනැගිල්ල සහ අනෙකුත් සෑම සියලු දේ ද වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,

01 - 139

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 නොවැම්බර් මස 28 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

(ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. එස්. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද 2015.11.26 දිනැති අංක 694 දරන උකස් බැඳුම්කරය, 2015.11.26 දිනැති අංක 695 දරන උකස් බැඳුම්කරය, 2015.11.26 දිනැති අංක 696 දරන උකස් බැඳුම්කරය, 2016.04.01 දිනැති අංක 741 දරන උකස් බැඳුම්කරය, 2016.08.12 දිනැති අංක 768 දරන උකස් බැඳුම්කරය, 2016.08.12 දිනැති අංක 767 දරන උකස් බැඳුම්කරය සහ 2017.11.16 දිනැති අංක 873 දරන උකස් බැඳුම්කරය, මත අයවිය යුතු ගෙවීම් කිරීම, බදුල්ලේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ අංක PV92591 දරන අංකයෙන් ලියාපදිංචි කොට යථා පරිදි සංස්ථාගත කරන ලද ක්ලැසික් වෝටර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මින්මතු මෙහි "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2018 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී ක්ලැසික් වෝටර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 694, 695, 696, 741, 768, 767 සහ 873 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් හය කෝටි හැත්තෑ එක් ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසිය තිස් පහයි ශත තිස් නවයක (රු. 67,172,435.39) මුදලක් ද, 2018 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දෙකෝටි පනස් නව ලක්ෂ පනස් දහස් දෙසිය හතලිස් දෙකයි ශත තිස් එකක (රු. 25,950,242.31) මුදල මත සෑම මසකම වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ට ඉහළින් ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද, රුපියල් පනස් හතර ලක්ෂ තිස් අට දහස් අටසිය හැට අටක (රු. 5,438,868.00) මුදල මත වර්ෂයකට සියයට දොළහක් (12.0%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද, රුපියල් එක් කෝටි හතලිස් නව ලක්ෂ තිස් හත් දහස් තුන්සිය අසූ හතරක (රු. 14,937,384.00) මුදල මත සෑම වර්ෂයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ට ඉහළින් ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද සහ රුපියල් එක් කෝටි හැත්තෑ අට ලක්ෂ අසූ දහස් නවසිය එකයි ශත හතලිස් දෙකක (රු. 17,880,901.42) මුදල මත වර්ෂයකට සියයට විසි අටක් (28%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තවද, එකී මුදල වන රුපියල් හය කෝටි හැත්තෑ එක් ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසිය තිස් පහයි ශත තිස් නවයක (රු. 67,172,435.39) මුදලක් ද, 2018 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දෙකෝටි පනස් නව ලක්ෂ පනස් දහස් දෙසිය හතලිස් දෙකයි ශත තිස් එකක (රු. 25,950,242.31) මුදල මත සෑම වර්ෂයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ට ඉහළින් ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද, රුපියල් පනස් හතර ලක්ෂ තිස් අට දහස් අටසිය හැට අටක (රු. 5,438,868.00) මුදල මත වර්ෂයකට සියයට දොළහක් (12.0%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද, රුපියල් එක් කෝටි හතලිස් නව ලක්ෂ තිස් හත් දහස් තුන්සිය අසූ හතරක (රු. 14,937,384.00) මුදල මත සෑම මසකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ට ඉහළින් ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද සහ රුපියල් එක් කෝටි හැත්තෑ අට ලක්ෂ අසූ දහස් නවසිය එකයි ශත හතලිස් දෙකක (රු. 17,880,901.42) මුදල මත වර්ෂයකට සියයට විසි අටක් (28%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ක්ලැසික් වෝටර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ පලිස්කාර මුදියන්සේලාගේ නදීශානි පලිස්කාර යන අය විසින් ඉහත කී අංක 694, 695, 696, 741, 768, 767 සහ 873 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන දේපළ සහ යන්ත්‍ර, අයි. ඩබ්ලිව්. ජයසූරිය, මහනුවර බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 694 සහ 741 දරන උකස් බැඳුම්කරයන් මගින්**
**උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර සභා බලසීමාව තුළ, කටුපැලැල්ලෙගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිළිපොතගම පිහිටි "තිඹිරිගහවත්ත" යනුවෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කේ. පී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද 2004.01.28 දිනැති අංක 6896 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි පාර ද, නැගෙනහිරට : පයිප් ලයින් පාර ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට : ජයසුන්දර සහ වෙනත් අයගේ ඉඩම ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ හතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 1, පර්. 17.48) විශාල ඉඩම සහ එහි පිහිටි කැප්පෙටිපොල පාර, වරිපනම් අංක 23 දරන ගොඩනැගිල්ල සහ අනෙකුත් සෑම සියලු දේ ද වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. එල්. අරුණකාන්ත විසින් මැතකදී කරන ලද 2013.03.09 දිනැති අංක 349 දරන මැනුම් පිඹුරට අනුව ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර සභා බලසීමාව තුළ, 78-S කටුපැලැල්ලෙගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිළිපොතගම පිහිටි "තිඹිරිගහවත්ත" යනුවෙන් හඳුන්වන ඉඩමට (බලයලත් මිනින්දෝරු විසින් මැන සාදන ලද 2004.01.28 දිනැති අංක 6896 දරන පිඹුරේ ලොට් 1 හි නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්.

එල්. අරුණකාන්ත විසින් මැතකදී කරන ලද 2013.03.09 දිනැති අංක 349 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : පඩි (Steps) ද, නැගෙනහිරට : පයිප් ලයින් පාර ද, දකුණට : බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. එල්. අරුණකාන්තගේ 2012/183 දරන පිඹුරේ ලොට් 1 ද සහ බස්නාහිරට : ජයසුන්දර සහ වෙනත් අයගේ ඉඩම ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ හතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 1, පර්. 17.48) විශාල ඉඩම සහ එහි පිහිටි කැප්පෙටිපොල පාර, වරිපනම් අංක 23 දරන ගොඩනැගිල්ල සහ අනෙකුත් සෑම සියලු දේද වේ.

**අංක 695 දරන උකස් බැඳුම්කරය මගින්**
**උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, වැවගම් පත්තුවේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්පාර නගර සභා බලසීමාව තුළ ඉන්ද්‍රසාරපුර ග්‍රාම සේවක කොට්ඨාසයේ ඉන්ද්‍රසාරපුර (අම්පාර "A" කලාපය) ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද පිඹුරු අංක 280001 හි ලොට් අංක 522 දරන "බෝඩ් ලැන්ඩ්" යනුවෙන් හඳුන්වන ඉඩමට මායිම්, උතුරට : ලොට් 518 ද, නැගෙනහිරට : ලොට් 523 ද, දකුණට : අංක 280007 පිඹුරේ ලොට් 02 ද, සහ බස්නාහිරට : ලොට් 521 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0110ක් විශාල ඉඩම සහ එහි පිහිටි අනෙකුත් සෑම සියලු දේ ද වේ. මෙය අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත. එකී අංක 280001දරන පිඹුරේ දැක්වෙන මාර්ග ඔස්සේ සහ උඩින් වන මාර්ග අයිතිය ද සමග වේ.

**අංක 696 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

පහත දැක්වෙන චංචල පිරියත, යන්ත්‍ර සහ උපකරණ ද ඇතුළත්ව

| *අංකය* | *අයිතමය* | *ඒකක* |
|---|---|---|
| 01. | ආර්ඕ ප්ලාන්ට්ස් - 1,000 එල්පීඑච් (RO Plants - 1,000 LPH) | 01 |
| 02. | මයික්‍රියොන් ෆිල්ටර් පීපී 10" (Micrion Filter PP 10") | 01 |
| 03. | ආර්. 0 ස්කිඩ් (R, 0 Skid) | 01 |
| 04. | ඉලෙක්ට්‍රිකල් කන්ට්‍රෝල් පැනල් (Electrical Control Panel) | 01 |
| 05. | මෙම්බ්‍රන්ස් (සීඑස්එම්/හයිඩ්‍රෙනටික්ස්) ([Membrance (CSM/Hydraunatics)] | 01 |
| 06. | ආර්. 0 සිංගල් ඉලමනට් හවුසිං (R, 0 Single Element Housing) | 01 |
| 07. | රෝට මීටර් (ඔප්ෂනල්) (Rota Meter (Optional) | 01 |
| 08. | ප්‍රේෂර් ගේජ් ග්ලසරින් (Pressure Gauge Glycerin) | 02 |
| 09. | ලෝ ප්‍රේෂර් ස්විච් (Law Pressure Switch) | 01 |
| 10. | හයි ප්‍රෙෂර් ස්විච් (High Pressure Switch) | 01 |

| *අංකය* | *අයිතමය* | *ඒකක* |
|---|---|---|
| 11. | කන්ඩක්ටිවිටි මීටර් (ඇනලොග්)<br>(Conductivity Meter (Analog) | 01 |
| 12. | ඉන්ටර්කනෙක්ටිං පයිප්ප<br>(Inetrconnecting Pipes) | 01 |

සහ අමතර කොටස් උපාංග සහ උපකරණ ද, බදුල්ල, ජලනල මාවත, පින්නලන්ද ගාඩ්න්ස්, අංක 15 දරන ස්ථානයේ දැනට තබා තිබෙන යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන වෙනත් සියලු චංචල පරියත, යන්ත්‍රෝපකරණ, කලින් කල හා සෑමකල්හිම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන සමාගමේ වෙනත් සියලු චංචල පිරියත යන්ත්‍ර, උපකරණ සහ උපාංග සහ මින්මතු මේ බැඳුම්කරය බලාත්මකව පවත්නා කාල ඇතුළත සහ සෑම කල්හිම වරින් වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තිබිය යුතු හා තිබිය හැකි සමාගමේ වෙනත් සියලු චංචල දේපළ සහ මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි, ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ ගෙන එනු ලැබිය හැකි, එකී ව්‍යාපාර චංචල පිරියත යන්ත්‍රෝපකණ අමතර කොටස් සහ උපාංග වේ.

**අංක 768 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

පහත දැක්වෙන චංචල පිරියත යන්ත්‍ර සහ උපකරණ ද ඇතුළත්ව

| *අනු. අංකය* | *අයිතමය* | *ධාරිතාවය* |
|---|---|---|
| 01. | වෝටර් පියුරිෆිකේෂන් සිස්ටම් (ආර්ඕ වෝටර් ට්‍රීට්මන්ට්)<br>(Water Purification System [R] Water Treatment) | ලීටර්ස්/පැය<br>(Liters/hours) |

| *අනු. අංකය* | *විස්තරය* |
|---|---|
| 01. | පෙට් බ්ලෝ මෝල්ඩිං මැෂින්ඔටෝ ඩ්‍රොප් කැපැසිටි (මි.ලි. 200 සිට මි.ලී. 2000 දක්වා) විත් ඉන්ෆ්‍රා රෙඩ් හීටර්<br>[Pet Blow Moulding Machine Auto Drop Capacity (200 ml to 2000 ml with infra red heater)] |
| 02. | කම්ප්‍රෙෂර් - 20 හෝස් පවර් කැපැසිටි (Compressor - 20HP Capacity) |
| 03. | චිලර් - 2 ටොන් කැපැසිටි (Chiller 2 - Ton Capacity) |
| 04. | එයාර් ඩ්‍රයර් - 10 සීඑෆ්එම් කැපැසිටි (Air Dryer - 40 CFM Capacity) |

**ටෙක්නිකල් ස්පෙසිෆිකේෂන් (තාක්ෂණික පිරිවිතර) :**

| | |
|---|---|
| පෙට් බ්ලෝ මැෂින් (Pet Blow Machine) | 01 |
| මොඩල් නම්බර් (Model Number) | ඊජීටී 1000 (සෙමි-ඔටොමැටික්)<br>(EGT 1000 (Semi - Automatic) |
| බොට්ල් පර් අවර් (Bottle Per Hour) | (800 - 1000) බීපීඑච්<br>(800 - 1000) Bph |
| පවර් කැපැසිටි (Power Capacity) | 1 කිවො (1 Kw) |
| මැෂින් වේට් (Machine Weight) | 800 කිග්‍රෑ. (800 Kgs.) |

**ඔටොමැටික් බොට්ලිං මැෂින් :**

| | |
|---|---|
| මොඩල් නම්බර් (Model Number) | ඊජිටී 1800 (Egt 1800) |
| ෆිලිං කැපැසිටි (Filling Capacity) | 300 එම්අයි සිට 2000 එම්අයි (300 MI to 2000 MI) |
| බෝට්ල්ස් පර් අවර් (Bottle's per hour) | 1800 (1000 එම්අයි) [1800 (1000 MI)] |
| මැෂින් සයිස් (Machine Size) | 1750 x 1500 x 1950 එම්එන් (1750 x 1500 x 1950) |

**රසායනාගාර උපකරණ** (Lab Equipments) :

| *අනු අංකය* *Serial No.* | *විස්තරය* *Particulars* | *නිෂ්පාදනය* *Make* | *ප්‍රමාණය* *Quantity* |
|---|---|---|---|
| 1. | ඉන්කියුබේටර් (Inqubator) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 2 |
| 2. | හොට් එයාර් අවන් (Hot Air Oven) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 1 |
| 3. | බී. ඕ. ඩී. ඉන්කියුබේටර් (B. O. D. Inqubator) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 2 |
| 4. | ඔටෝ ක්ලේව් (Auto Clave) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 1 |
| 5. | වෝටර් බාත් (Water Bath) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 1 |
| 6. | වෝටර් ස්ටිල් (Water Still) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 1 |
| 7. | හොට් ප්ලේට් (Hot Palte) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 1 |
| 8. | හීටිං මනි (Heating Manih) | බීඅයිඕඑෆ්අයිටී BIOFIT | 1 |
| 9. | ලමිනාර් එයාර් ෆ්ලෝ (Laminar Air Flow) | සීඒඑස් CAS | 1 |
| 10. | පී එච් මීටර් (PH Meter) | සන්සෙල් SANSEL | 1 |
| 11. | ටීඩීඑස් මීටර් (TDS Meter) | සන්සෙල් SANSEL | 1 |
| 12. | නෙෆ්ලෝ මීටර් (Nephlo Meter) | සන්සෙල් SANSEL | 1 |

| *අනු අංකය* *Serial No.* | *විස්තරය* *Particulars* | *නිෂ්පාදනය* *Make* | *ප්‍රමාණය* *Quantity* |
|---|---|---|---|
| 13. | කොලනි කවුන්ටර් (Colony Counter) | සන්සෙල් SANSEL | 1 |
| 14. | ස්පෙක්ට්‍රො ෆොටෝ මීටර් (Spectro Photo Meter) | ඊඑල් 100 EL 100 | 1 |
| 15. | බැලන්ස් (Balance) | ඩීඑච්ඕඑන්ඒ DHONA | 1 |
| 16. | මයික්‍රොස්කෝප් (Microscope) | ඩීඅයිඑස්අයිඕඑන් VISION | 1 |
| 17. | මැග්නටික් ෂිෆර් (Magnetic Shiper) | ආර්ඊඑම්අයි REMI | 1 |
| 18. | වැකියුම් පම්ප් (Vaccum Pump) | වීඒඑල්යූඊ VALUE | 1 |
| 19. | ෆියුම් හුඩ් (Fume Hood) | | |
| 20. | ඩාක් යූවී චේම්බර් (Dark UV Chamber) | | |
| 21. | ග්ලාස්වෙයාර් (Glassware) | | |
| 22. | කෙමිකල්ස් (Chemical) | | |

| *අයිතමය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | ඒඑච්ඩී 32 චැනල් ඩීවීආර් (AHD 32 Chanel DVR) | 1 |
| 2. | ඩබ්ලිව්එම්-ඒඑච්ඩී-38එච්ආර්/2සීඊ-1 ඉන්ඩෝ කැමරා (WMAHD 38HR/2CE-1 Indoor Camera) | 18 |
| 3. | ඩබ්ලිව්එම්-ඒඑච්ඩී-39එච්ආර්/5ඩීඊ-1 අවුට්ඩෝ (WM-AHD-39HR/5DE-1 Outdoor) | 14 |
| 4. | 6ටීබී ඩබ්ලිව්ඩී පර්පල් එච්ඩීඩී (6TB WD Puple HDD) | 2 |
| 5. | නෙට්වර්ක් කැබින් 16 යූ (Network Cabin 16U) | 1 |
| 6. | 12 වී 2ඒ පවර් ඇඩප්ටර් (12V 2A Power Adoptor) | 24 |

| *අයිතමය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 7. | එම්එක්ස් බීඑන්සී කනෙක්ටර් (MX BNC Connector) | 2400 |
| 8. | යූපීඑස් 1200 වීඒ (UPS 1200 VA) | 1 |
| 9. | කැලණි ඔරිජිනල් 3සී2වී කේබල් (එම්) (Kaleni Original 3c 2v Cable (M)) | 1200 |
| 10. | ටීටී කේබල් (TT Cable) | 1200 |
| 11. | 24 පෝට් ස්විච් 10/1000 (24 Port Switch 10/1000) | 1 |
| 12. | ඒඑස්යූඑස් 23 ෆුල් එල්ඊඩී මොනිටර් විත් බ්‍රැකට් (Asus 23 Full LED Monitor with Bracket) | 2 |
| 13. | සප්ලයිං ඇන්ඩ් ඉන්ස්ටොලේෂන් ඔෆ් නෙසසර් කැබ්ලින් පීවීසී කසිනා ඇන්ඩ් අදර්ස් (Supplying and Installation of Necessar Cablin PVC  Casina and others) | 24 |
| 14. | එස්ඩබ්ලිව්-2ඊ ඇරෙස්ටර්ස් 8 චැනල් (SW-2e arrestors 8 Chanel) | 3 |

සීඅයිඑක්ස්අයි එච්ඊඑස්ඊඑම්ඊ ඉලෙක්ට්‍රික් (CIXI HESEME ELELCTRIC)
වෝටර් ඩිස්පෙන්සර් (WATER DISPENSER)
එච්එස්එම් - 93 එල්බීඒ (ෆුල් සිල්වර්) (HSM-93LBA [FULL SILVER])
එච්එස්එම් - 96 එල්බීඒ (බ්ලැක් ඇන්ඩ් සිල්වර්) (HSM-96LBA [BLACK & SILVER])
එච්එස්එම් - 93 එල්ඒ (ෆුල් සිල්වර්) (HSM-93LA [FULL SILVER])

එක්රේන් ටෙක්නොලොජීස් ඇන්ඩ් සොලියුෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
(EKRAIN TECHNOLOGIES AND SOLUTIONS (PVT) LTD

| *විස්තරය (Description)* | *ප්‍රමාණය (Quantity)* |
|---|---|
| ටීඑක්ස් 628 කලර් ඩිස්ප්ලේ ෆින්ගර්ප්‍රින්ට් මැෂින් (TX 628 Colour Display Fingerprint Machine) | 1 |
| ඩෝර් ඇටෙන්ඩන්ස් ඇන්ඩ් පේරෝල් සොෆ්ට්වෙයාර් (Door Attendance & Payroll Software) | 1 |

සහ අමතර කොටස් උපාංග සහ උපකරණ ද බදුල්ල, ජලනල මාවත, පින්නලන්ද ගාඩ්න්ස්, අංක 15 දරන ස්ථානයේ දැනට තබා තිබෙන යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ දැනට තිබෙන වෙනත් සියලු චංචල පිරියත යන්ත්‍රෝපකරණ, කලින් කල හා සෑමකල්හිම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන සමාගමේ වෙනත් සියලු චංචල පිරියත යන්ත්‍ර උපකරණ සහ උපාංග සහ මින්මතු මේ බැඳුම්කරය බලාත්මකව පවත්නා කාල ඇතුළත සහ සෑම කල්හිම වරින් වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තිබිය හැකි සමාගමේ වෙනත් සියලු චංචල දේපළ සහ මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි, ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ ගෙන එනු ලැබිය හැකි, එකී ව්‍යාපාර චංචල පිරියත යන්ත්‍රෝපකරණ අමතර කොටස් සහ උපාංග වේ.

**අංක 767 සහ 873 දරන උකස් බැඳුම්කරයන් මගින්**
**උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, වැවගම් පත්තුවේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්පාර නගර සභා බලසීමාව තුළ මිහිඳුපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අම්පාර "1" කලාපය ගමේ පිහිටි "බෝඩ් ලැන්ඩ්" යනුවෙන් හඳුන්වන ඉඩමට සර්වේ ජනරාල්වරයා වෙනුවට මැනුම් අධිකාරිවරයා විසින් සාදන ලද ක්ෂේත්‍ර සටහන් අංක 57/18/2 හා 4 හි පිඹුරු අංක පීපී/අම්/1458 හි ලොට්

අංක 2 දරන මායිම්, උතුරට : ලොට් 1 සහ බෝඩ් ලැන්ඩ් ද, නැගෙනහිරට : බෝඩ් ලැන්ඩ් ද, දකුණට : බෝඩ් ලැන්ඩ් ද සහ බස්නාහිරට : බෝඩ් ලැන්ඩ් සහ ලොට් 1 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.3450ක් විශාල ඉඩම සහ එහි පිහිටි අනෙකුත් සෑම සියලු දේ ද එකී පිඹුරේ දැක්වෙන මාර්ග ඔස්සේ සහ උඩින් වන මාර්ග අයිතිය ද සමග වේ. මෙය අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01 - 142

---

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 නොවැම්බර් මස 28 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීපා පී. වික්‍රමතිලක විසින් ලියා සහතික කරන ලද 2017 සැප්තැම්බර් මස 15 දිනැති අංක 2439 හා 2441 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම හෙයියන්තුඩුවේ වැලිගම රාලලාගේ රංගන ලසන්ත සුගතදාස යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2018 සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී වැලිගම රාලලාගේ රංගන ලසන්ත සුගතදාස යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 2439 හා 2441 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් එක් කෝටි තුන් ලක්ෂ හතලිස් හය දහස් අටසිය දහ හතයි ශත තිස් නවයක (රු. 10,346,817.39) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් තිස් අට ලක්ෂ අනූ හය දහස් හතලිස් පහයි ශත විසි නවයක (රු. 3,896,045.29) මුදල මත 2019 සැප්තැම්බර් මස 15 වැනි දින දක්වා වර්ෂයකට සියයට දහනවයක් (19.0%) බැගින් සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සතිපතා ප්‍රකාශයට පත් කරනු ලබන, සෑම මාසයකම වැඩි කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට අටක් (8%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද රුපියල් පනස් හත් ලක්ෂ අනූ හත් දහස් අටසිය දහසයයි ශත අසූ පහක (රු. 5,797,816.85) මුදල මත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සතිපතා ප්‍රකාශයට පත් කරනු ලබන සෑම, සතියකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට අටක් (8%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් එක් කෝටි තුන් ලක්ෂ හතලිස් හය දහස් අටසිය දහ හතයි ශත තිස් නවයක (රු. 10,346,817.39) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් තිස් අට ලක්ෂ අනූ හය දහස් හතලිස් පහයි ශත විසි නවයක (රු. 3,896,045.29) මුදල මත 2019 සැප්තැම්බර් මස 15 වැනි දින දක්වා වර්ෂයකට සියයට දහනවයක් (19.0%) බැගින් සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සතිපතා ප්‍රකාශයට පත් කරනු ලබන, සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට අටක් (8%) බැගින් වූ අනුපාතිය මත වන පොළිය ද සහ රුපියල් පනස් හත් ලක්ෂ අනූ හත් දහස් අටසිය දහසයයි ශත අසූ පහක (රු. 5,797,816.85ක) මුදල මත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සතිපතා ප්‍රකාශයට පත් කරනු ලබන, සෑම සතියකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට අටක් (8%) බැගින් වූ අනුපාතය මත වන පොළියද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා වැලිගම රාලලාගේ රංගන ලසන්ත සුගතදාස යන අය විසින් ඉහත කී අංක 2439 හා 2441 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල සහ පරිශ්‍රය තුසිත් කරුණාරත්න, කොළඹ බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 2439 හා 2441 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත, මහර ඉහළ කරගහමුණ පිහිටි පානදුරයගේවත්ත හෙවත් මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 1996.07.14 දිනැති අංක 307/1996 දරන පිඹුරේ ලොට් 3B වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 3A ද, නැගෙනහිරට : නිමල් කරුණාවතීගේ ඉඩම සහ එස්. ඩී. සීමන්ගේ උරුමකරුවන්ගේ ඉඩම ද, දකුණට : එස්. ඩී. රූපසිංහගේ ඉඩම ද සහ බස්නාහිරට : ලොට් X ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සෑම සියලු දේ ද වේ.

මෑතකදී කරන ලද නැවත මැනීමකට අනුව ඉහත කී ලොට් 3B, පහත පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත, මහර ඉහළ කරගහමුණ පිහිටි පානදුරයගේවත්ත හෙවත් මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් මැන සාදන ලද 2007.02.07 දිනැති අංක 122/2007 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 307/1996 දරන පිඹුරේ ලොට් 3A ද, නැගෙනහිරට : නිමල් කරුණාවතීගේ ඉඩම සහ එස්. ඩී. සීමන්ගේ උරුමකරුවන්ගේ ඉඩම ද, දකුණට : එස්. ඩී. රූපසිරි මංගලිකා පත්මකාන්තිගේ ඉඩම ද සහ බස්නාහිරට : අංක 307/1996 දරන පිඹුරේ ලොට් X ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සෑම සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 1996.07.14 දිනැති අංක 307/1996 දරන පිඹුරේ ලොට් X වශයෙන් ලකුණු කරන ලද මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01 - 141

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 නොවැම්බර් මස 28 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් නදී ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද 2014 ජූලි මස 02 දිනැති අංක 6673 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම අනුරාධපුරයේ හේවා වසම් වඩුගේ සුනිල් ජයවර්ධන යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2018 සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී හේවා වසම් වඩුගේ සුනිල් ජයවර්ධන යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 6673 දරන උකස් බැඳුම්කරය මත රුපියල් පනස් පන් ලක්ෂ අසූ හත් දහස් අටසිය පනස් හතයි ශත අනූ හයක (රු. 5,587,857.96) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් ලක්ෂ හතලිස් දෙදහස් හාරසිය දහ හතයි ශත විසි එකක (රු. 5,042,417.21) මුදල මත වර්ෂයකට සියයට දහසයක් (16%) වූ අවම අනුපාතිකයට යටත්ව සෑම වර්ෂයකම මාස තුනකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් පනස් පන් ලක්ෂ අසූ හත් දහස් අටසිය පනස් හතයි ශත අනූ හයක (රු. 5,587,857.96) මුදලක් ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් ලක්ෂ හතලිස් දෙදහස් හාරසිය දහ හතයි ශත විසි එකක (රු. 5,042,417.21) මුදල මත වර්ෂයකට සියයට දහසයක් (16%) වූ අවම අනුපාතිකයකට යටත්ව සෑම වර්ෂයකම මාස තුනකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ස්ථානීය ඉහළින් වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) බැගින් වූ අනුපාතය මත වන පොළිය ද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන)

පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී හේවා වසම් වඩුගේ සුනිල් ජයවර්ධන යන අය විසින් ඉහත කී අංක 6673 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල පරිශ්‍රය අයි. ඩබ්ලිව්. ජයසූරිය, මහනුවර බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 6673 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදරා කෝරළේ, අනුරාධපුර මහ නගර සභා බලසීමාව තුළ, අනුරාධපුර නගර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පියවර III හි පිහිටි "කුඹීච්චිකුලමමූකලාන" නමැති ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද සහ ඔහු භාරයේ ඇති ක්ෂේත්‍ර සටහන් 03හි අවසන් ගම් සිතියම් අවසන් නගර සිතියම් A4 හි ලොට් 105 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් අංක 100 පාර (මහ නගර සභා) සහ 104 ද, නැගෙනහිරට : ලොට් 104, 109 සහ 108 ද, දකුණට : ලොට් 108 සහ 106 ද සහ බස්නාහිරට : ලොට් 106 සහ 100, පාර (මහ නගර සභා) ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි අටයි දශම නවයයි හතරක් (අ. 0, රූ, 0 පර්. 28.94) විශාල ඉඩම සහ එහි පිහිටි අනෙකුත් සැම සියලු දේ ද වේ.

මෑතකදී කරන ලද නැවත මැනීමකට අනුව ඉහත ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදරා කෝරළේ, අනුරාධපුර මහ නගර සභා බලසීමාව තුළ, අනුරාධපුර නගර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පියවර III හි පිහිටි "කුඹීච්චිකුලමමූකලාන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් සාදන ලද 2006.09.12 දිනැති අංක 2586 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අවසන් නගර සිතියම් A4හි ලොට් අංක 100 පාර (මහ නගර සභා) සහ 104 ද, නැගෙනහිරට : අවසන් නගර සිතියම් A4හි ලොට් 104, 109 සහ 108 ද, දකුණට : අවසන් නගර සිතියම් A4හි ලොට් 108 සහ 106 ද සහ බස්නාහිරට : අවසන් නගර සිතියම් A4හි ලොට් 106 සහ 100, පාර (මහ නගර සභා) ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි අටයි දශම නවයයි හතරක් (අ. 0, රූ. 0, පර්. 28.94) විශාල ඉඩම සහ එහි පිහිටි අනෙකුත් සැම සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01 - 140

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ආර්. ඩී. ජයසිංහ.
ගිණුම් අංක : 1103 5449 1535.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017.07.27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2015 නොවැම්බර් මස 24 දාතම හා අංක 1418 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රසිත දුමින්ද ජයසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 1418 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි හතලිස් හය ලක්ෂ පනස් අට දහස් එකසිය හැට දෙකයි ශත හතක (රු. 14,658,162.07) මුදලක් 2017 ජූලි 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක්කෝටි හතලිස් හය ලක්ෂ පනස් අට දහස් එකසිය හැට දෙකයි ශත හතක (රු. 14,658,162.07) මුදලද, 2017 ජූලි මස 03 වැනි දින සිට අංක 1418 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි හතලිස් එක් ලක්ෂ හතලිස් අට දහස් හාරසිය එකොළහයි ශත හැට පහක (රු. 14,148,411.65) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම පහක් (10.5%) බැගින් වූ පොළියද , දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1418 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩ පත්තුවේ, රත්නපුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ රත්නපුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක 153 B මාලංගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාලංගම ග්‍රාමයේ පිහිටි "බතලහේන නොහොත් විලකොළදෙනිය එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානත තැන ආර්. එස්. රණතුංග යන අය විසින් සාදන ලද 2014 පෙබරවාරි 23 දාතම හා අංක 1382 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 31 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 30 සහ 13 (මීටර් 5.0 පළල පිවිසුම් මාර්ගය), නැගෙනහිරට : ලොට් 13 (මීටර් 5.0 පළල පිවිසුම් මාර්ගය) සහ අංක 1851 දරන පිඹුරේ ලොට් 1, දකුණට : අංක 1851 දරන පිඹුරේ ලොට් 1 සහ අංක 680 දරන පිඹුරේ ලොට් 1 සහ බස්නාහිරට : අංක 680 දරන පිඹුරේ ලොට් 1 සහ අංක 577 දරන පිඹුරේ ලොට් 1 සහ 2 සහ ලොට් 30 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හතක් (A:0, R:0, P:13.7) හෝ හෙක්ටයාර 0.0346 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක 1382 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 84/43 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ඉඩම් කොටස් දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

එකී "බතලහේන නොහොත් විලකොළදෙනිය එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානත තැන ආර්. එස්. රණතුංග යන අය විසින් සාදන ලද 2014 පෙබරවාරි මස 23 දාතම හා අංක 1382 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 13 (පිවිසුම් මාර්ගය) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, සහ 12, නැගෙනහිරට : වලන්දුරේට පාර, ලොට් 20, 25, 36, 17, 27, 34, 38, 43, 15, 29, 32 සහ 40, දකුණට : වලන්දුරේට පාර, ලොට් 22, 21, 20, 19, 18, 17, 16 සහ 15 සහ බස්නාහිරට : ලොට් 31, 30, 14 සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් දෙකයි දශම හතක් (A:0, R:1, P:32.7) හෝ හෙක්ටයාර 0.0346 විශාල ඉඩම් කොටස සමග එකී අංක 1382 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 80/108 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී "බතලහේන නොහොත් විලකොළදෙනිය එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානත තැන ආර්. එස්. රණතුංග යන අය විසින් සාදන ලද 2014 පෙබරවාරි මස 23 දාතම හා අංක 1382 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 47 (පිවිසුම් මාර්ගය) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 13, නැගෙනහිරට : ලොට් 40, 41, 45 සහ 46, දකුණට : වලන්දුරේට පාර සහ බස්නාහිරට : බලයලත් මානත තැන ඊ. ඊ. විජේසූරිය යන අය විසින් සාදන ලද අංක 1851 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ තුනක් (A:0, R:0, P:13) විශාල ඉඩම් කොටස සමග එකී අංක 1382 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 80/109 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01 - 133/5

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ජේ. ඒ. එෆ්. මරික්කාර් සහ එෆ්. එම්. එම්. ෆෙරෝස්.
ගිණුම් අංක : 0032 5003 3868.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.11.29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. ආර්. රත්ගම යන අය විසින් ලියා සහතික කරන ලද 2016 සැප්තැම්බර් මස 28 දාතම හා අංක 1533 දරන, 2016 ඔක්තෝබර් 17 දාතම හා අංක 1548 දරන 2017 ඔක්තෝබර් 11 දාතම හා අංක 2054 දරන සහ 2018 මාර්තු 29 දාතම හා අංක 2303 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රයෙන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජයිනුල් අබ්දීන් ෆුවාර්ඩ් මරික්කාර් සහ ෆුවාර්ඩ් මයික්කාර් මොහොමඩ් ෆෙරෝස් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 1533, 1548, 2054 සහ 2303 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පහළොස් කෝටි හැත්තෑ හත් ලක්ෂ තිස් පන් දහස් තුන්සිය හතයි ශත පනස් හතක (රු. 157,735,307.57) මුදලක්, 2018 නොවැම්බර් 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් පහළොස් කෝටි හැත්තෑ හත් ලක්ෂ තිස් පන් දහස් තුන්සිය

හතයි ශත පනස් හතක (රු. 157,735,307.57) මුදලද, 2018 නොවැම්බර් මස 07 දින සිට අංක 1533, 1548, 2054 සහ 2303 දරන එකී බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ හතර කෝටි හැත්තෑ හතර ලක්ෂ පනස් දහසක (රු. 147,450,000.00) මුදලක් සඳහා වාර්ෂිකව at an interest rate of Average Weighted Prime Landing Rate + Two Per centum (2%) per annum බැගින් වූ පොළියද , දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක. 1533, 1548, 2054 සහ 2303 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ, පිටකඳ - 250 ග්‍රාමසේවා කොට්ඨාසයේ මහියාව පිහිටි සී. ඩී. එල්. ප්‍රනාන්දු මාවත, වරිපනම් අංක 05 දරන "කිරිල්ලගොඩවත්ත" යයි කියනු ලබන බලයලත් මානක තැන සී. ඩී. අධිහෙට්ටි යන අය විසින් සාදන ලද 2016 මැයි 29 දාතම හා අංක 6013 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන එෆ්. මාපලගම යන අය විසින් සාදන ලද අංක 3192 දරන පිඹුරේ ලොට් 1 සහ පිවිසුම් මාර්ගය, නැගෙනහිරට : පාර සහ කටුගස්තොට පාර, වරිපනම් අංක 249 දරන පරිශ්‍රයන්, දකුණට : බලයලත් මානක තැන එෆ්. මාපලගම යන අය විසින් සාදන ලද අංක 4233 දරන පිඹුරේ ලොට් 4 සහ බස්නාහිරට : බලයලත් මානත තැන එෆ්. මාපලගම යන අය විසින් සාදන ලද අංක 3192 දරන පිඹුරේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිහක් (A:0, R:1, P:30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 6013 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව A 583/130 (වෙනත් විස්තර තීරුව) යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මෙම පිඹුරේ නිරූපිත ප්‍රධාන පාරෙන් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී මහියාව පිහිටි "කිරිල්ලගොඩවත්ත" යයි කියනු ලබන බලයලත් මානක තැන එෆ්. මාපලගම යන අය විසින් සාදන ලද 1966 ජූනි 25 දාතම හා අංක 4233 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට් 2 සහ 3 (293 වශයෙන් සාවද්‍යව ලියාපදිංචි කොට ඇති) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්. ඩබ්ලිව්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහත්මිය වෙත වෙන්කර දෙන ලද බලයලත් මානක තැන එෆ්. මාපලගම යන අය විසින් සාදනලද අංක 3192 දරන පිඹුරේ ලොට් 1, ඊසානට : අංක 4233 දරන පිඹුරේ A, B, C, D වශයෙන් ලකුණුකොට ඇති පාර, ගිණිකොනට : එච්. එල්. රත්වත්ත මහතාට අයිති දේපළ, දකුණට : අංක 4233 දරන පිඹුරේ ලොට් 4, 5, 6 සහ 7 සහ බස්නාහිරට : ඩොක්ටර් සීවලි රත්වත්ත වෙත වෙන්කර දෙන ලද අංක 3192 දරන පිඹුරේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටයි දශම හතයි පහක් (A:0, R:1, P:28.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 4233 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව A 583/141 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මෙම ඉඩම බලයලත් මානක තැන සී. ඩී. අධිහෙට්ටි යන අය විසින් සාදන ලද 1987 නොවැම්බර් මස 12 දාතම හා අංක 1018 දරන පිඹුරේ ලොට් 1 - 4 වශයෙන් දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01 - 133/4

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එස්. එන්. හරිස්චන්ද්‍ර
ගිණුම් අංක : 1189 5738 6775.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.11.29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

